# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ප්‍රාදේශීය සභා (සංශෝධන)

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත කැටගොඩ මහතා විසින්
2023 ජූලි මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජුනි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[185 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මෙම පනත 2023 අංක  දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**5(2)(ඇ) අලුත් වගන්තිය ඇතුළත් කිරීම**

**2.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 5(2)(ආ) වගන්තියට ඉක්බිතිව පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 5(2)(ඇ) වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

"(ඇ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක දී, රටේ ඇතිවී ඇති යම්කිසි අර්බුදකාරී තත්ත්වයක් නිසා ප්‍රකාශිත පරිදි අදාළ ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි වන තත්ත්වයක් පැන නැගී ඇති අවස්ථාවක ඉහත 5(2)(ආ) විධානය පරිදි අමාත්‍යවරයා විසින් ධුර කාලය දීර්ඝ කරන ලද කාල සීමාව මාස 12 ක් ඉක්ම වී තිබුණේ වී නමුත් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන තවත් යම් කාලසීමාවක් සඳහා අදාළ විසිරුණු සභාව නැවත කැඳවීමට හැකි විය යුත්තේ ය.".

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.